අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

## උපදෙස් පත්‍රිකාව

### 1. දේශන කුසලතා ඇගයීම

මෙම නිපුණතා ඇගයීම අංශ හතර ම සඳහා පැවැත්වේ. පාරම්පරික දේශන සම්ප්‍රදායයන්ට අයත් විවිධ දේශනාවන් පිළිබඳ විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන දේශනාවක් සාම්ප්‍රදායික දේශන විලාසයට අනුව ඉදිරිපත් කළ යුතු ය.

#### 1.1. අභිමතාර්ථ

I. ලාංකික භික්ෂූන් වහන්සේලා විසින් සම්ප්‍රදායානුකූල ව පවත්වා ගෙන එනු ලැබූ දේශන ශෛලීන් අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා උනන්දු කරවීම.

II. සම්ප්‍රදාය ආරක්ෂා කර ගනිමින් ශාසන ගෞරවය සුරක්ෂිත වන පරිදි දේශන ක්‍රම ඉදිරිපත් කිරීමට පෙළඹවීම.

#### 1.2. ඇගයීම් කොන්දේසි

I. ඇගයීම් අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන දේශනාවක් හෝ කිහිපයක් ඉදිරිපත් කළ යුතු ය.

II. එක් අපේක්ෂකයෙකුට විනාඩි 07ක කාලයක් හිමි වේ.

III. සම්ප්‍රදායානුකූල දේශනා ශෛලීන් සුරැකෙන පරිදි ඉදිරිපත් කිරීම කළ යුතු ය.

IV. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසානාත්මක වේ.

V. ජාතික මට්ටම දක්වා පහත තේමා යටතේ දේශනා ඉදිරිපත් කළ යුතු ය.

- නමස්කාර ගාථා
- ජාතක කථා දේශනා
- දේවතාරාධනා
- විහාර අස්න
- අනුශාසනාව - අනුශාසනා අස්න
- පරිත්‍රාණ දේශනාවේ විවිධ ක්‍රම (පිරිත් පේ කිරීම, පොත පිරීම, ඉසිගිලි ගාථා, සූත්‍ර දේශනා, ආටානාටිය සූත්‍රය හා ඒ ඒ අවස්ථාවන්ට අදාළ නමස්කාර ක්‍රම)

#### 1.3. ලකුණු ලබා දීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| i. | සම්ප්‍රදායානුකූල බව | 10 |
| ii. | අක්ෂර හා වචන නිරවද්‍ය උච්චාරණය | 10 |
| iii. | ශ්‍රවණ මාධූර්යය | 10 |
| iv. | හඬ පාලනය | 10 |
| v. | ශාසන ගෞරවයෙන් යුතු ව ඉදිරිපත් කිරීම | 10 |
| | මුළු ලකුණු | 50 |